**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුමකරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමටඅදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍යප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණපහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවසන් ගිණුම් අනුව කාණ්ඩ 7කට අදාළ ස්ථාවර වත්කම්වල වටිනාකම් තහවුරු කර ගැනීම සඳහා ඊට අදාළ විස්තරාත්මක උපලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින් එම ස්ථාවර වත්කම්වල වටිනාකම සහ ඊට අනුරූපි ක්ෂය වටිනාකම්වල | 4,385,243 | ස්ථාවර වත්කම් ලේඛණය සහ විස්තරාත්මක උපලේඛන. | ස්ථාවර වත්කම් ලේඛනයක් සභාව සතුව නොමැති බව. ආරම්භක ශේෂයට නව මිලදී ගැනීම් ගළපන ලද වටිනාකම් 2023 අවසන් ගිණුම් තුළ ඇතුළත් කරන ලද බව සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර යාවත්කාලීන වටිනාකම් හඳුනාගැනීමටත්, ස්ථාවර වත්කම් ලේඛනයක් | ස්ථාවර වත්කම් ලේඛණය හා විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතුය. |

| | |
|---|---|
| නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සනාථ කරගත නොහැකි විය. | සකස් කිරීමටත් කටයුතු කරන බව. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 110. | හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | දැනට හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොගන්නා අතර, ඉදිරියේදී හානි පිළිබඳ ලේඛනයක් සකස් කර යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.132,698,921ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයරු. 69,109,561ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 63,589,360 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ ආදායම රු.39,393,827කින් වැඩි වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සභාවේ රක්ෂණ ආදායම හා ආයෝජන ආදායම පිළිවෙලින් රු.2,029,775කින් හා රු.37,364,052 කින් වැඩි වීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ වියදම රු.24,195,533කින් අඩු වී තිබූ අතර ඒ සඳහා මාර්ග ආරක්ෂණ කළමනාකරණ වියදම් හා ආයතනයේ පරිපාලන වියදම් පිළිවෙලින් රු.21,630,273 කින් හා රු.2,565,260 කින් අඩු වීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 දෙසැම්බර් 12 වන දිනැති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 351 හි 10.6 වගන්තිය අනුව රටේ මාර්ග ආරක්ෂාව වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා මෙම ආයතනය ජාතික කොමිෂන් සභාවක් බවට පත් කර ඊට අවශ්‍ය බලතල, අධිකාරිය හා මූල්‍ය සම්පත් ලබා දීම, කොමිෂන් සභාවේ කටයුතු වලට සහය වීම සඳහා ඉහළ සුදුසුකම් සහිත පුහුණුවලත් කාර්යමණ්ඩලයකින් සමන්විත පූර්ණ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම කළයුතු වුවද, උක්ත විධිවිධාන ප්‍රකාරව මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිතකර නොතිබීම හේතුවෙන් මෙම සභාවේ කාර්යන් ඉටුකිරීමට විධිමත් නෛතික බලයක් ලැබී නොතිබුණි. | කොමිෂන් සභාවක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කාර්යය තාවකාලිකව නවතා දමන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් දන්වන ලදි. එම පනත් කෙටුම්පත 2024 වර්ෂයේදී නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.තවද,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු, අධ්‍යක්ෂවරයෙක්, සහකාර අධ්‍යක්ෂවරයෙක් හා ගණකාධිකාරීවරයෙක් වශයෙන් කාර්ය මණ්ඩලය අනුමත කර ඇත. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 2245/31 හා 2021 සැප්තැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රක්ෂණ ආයතන 14ක් විසින් ප්‍රේෂණය කර තිබුණු රු.74,206,951 ක් රක්ෂණ ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගත හැකි ආකාරයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස්කර නොතිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හා රක්ෂණ ආයතනය සතුව රක්ෂණ දායකත්වයට අදාළ තොරතුරු නොමැති බැවින් එම ආයතනවල එකඟතාවය මත සභාව මඟින් රක්ෂණ ආයතන වෙත ලබා දී ඇති ආකෘති පත්‍රය අදාළ ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගෙන් හෝ ප්‍රධාන මූල්‍ය නිලධාරීගෙන් තහවුරුවක් සහිතව මාසිකව සභාව වෙත ලබා ගැනීමට කටයුතු කරන බව. | අදාළ රක්ෂණ ආයතන විසින් ප්‍රේෂණය කරනු ලබන මුදල්වල නිවැරදි භාවය තහවුරු කර ගත හැකි ආකාරයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 පෙබරවාරි 10 දිනැති රජයේ ගිණුම්කාරක සභාව විසින් ලබා දී තිබූ නියෝගය පරිදි ආයතනය විසින් අධික වේගය නිසා සිදු වන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් වසර තුනක් ගත වුවද අදාල නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021,2022,2023 ක්‍රියාකාරී සැලසුම්වල ඇතුළත් කර රු.මි.150 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය වේග මාපක ඇතුළු තාක්ෂණික උපකරණ ලබා දීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා වන රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගය අවලංගු කර ගැනීමේ අපේක්ෂාව ඇතිව 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්කාරක සභා නියෝගය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 (4) (ඇ) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පිළියෙල කර තිබුණු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.මිලියන 120 ක් වටිනා ක්‍රියාකාරකම් 31 ක් ක්‍රියාත්මකකිරීමට සැලසුම්කර කර තිබුණද, රු.මිලියන 52 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 20 ක කිසිදු කාර්යසාධනයක් වාර්තා වී නොතිබුණු අතර, තවත් ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 11ක අපේක්ෂිත ඉලක්කගත අරමුණු සැලසුම් කළ පරිදි ඉටු වී නොතිබුණු බවත්, එහි මූල්‍ය කාර්යසාධනයේ සාමාන්‍ය සියයට 10ක් පමණක් බවත් නිරීක්ෂණය වූයෙන්, ආයතනය විසින් 2023 වර්ෂය සඳහා සකස්කළ ප්‍රසම්පාදන සැලැස්ම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය. | සභාපති ධූරය 2023වසර තුලදී තෙවරක් වෙනස් වීම හේතුවෙන් ආශ්‍රිත තත්ත්වය 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කළ අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කලද අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් නව සංශෝධන ඇතුළත් කර 2024 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය ලේඛනය සකස් කරන ලදි. 2024 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධනය ලබා කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන සැලසුම තාත්වික වියයුතු අතර,ආයතනයේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා එමගින් කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්යය මණ්ඩලය සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතු වුවද මෙතෙක් මෙම ආයතනය කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරින් 14 දෙනෙකුගෙන් සමන්විතව කාර්ය මණ්ඩලය අනුයුක්ත කර අදාළ රාජකාරි ඉටුකර ගෙන යමින් පැවතුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් අනුව නවතා දමන ලද කොමිෂන් සභාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් අවසන් පනත් කෙටුම්පත 2024 වර්ෂයේදී නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදි. තවද, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවමඟින් පිළිවෙලින් සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු අධ්‍යක්ෂවරයෙක්, සහකාර අධ්‍යක්ෂවරයෙක් හා ගණකාධිකාරීවරයෙක් පත්කිරීම සහා අනුමැතිය ලැබී ඇත. | සභාව සඳහා අවශ්‍ය පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් අනුමතකර බඳවා ගැනීමට කටයුතු කළයුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු (Pillars) 05 ක් යටතේ ක්‍රියාත්මක කළ යුතු රු.මිලියන 110 ක් වටිනා ව්‍යාපෘති 22 කට අදාළව කාර්යයන් 35 ක් හඳුනාගෙන සැලසුම්කර තිබුණද,ඉන් රු.මිලියන 55ක වටිනාකමින් යුතු කාර්යයන්ගෙන් 21ක් එනම් සියයට 50ක් සම්පූර්ණයෙන්ම ඉටු කර නොතිබුණි. | සභාවේ සභාපති තනතුර විටින් විට වෙනස් වූ අතර 2023.06.16 දිනැති ජාතික සභා රැස්වීමේදී සභාවේ 2023 ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සංශෝධනය කළ අතර,ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කලද, අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් එම සංශෝධනයන් එක් කරමින් 2024 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලදි. | ක්‍රියාකාරී සැලැස්ම තාත්වික විය යුතු අතර සැලසුම් කල පරිදි එහි ඇතුළත් කාර්යයන් ඉටු කල යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇස්තමේන්තුගත වටිනාකම රු.මි.55 ක් වූ ව්‍යාපෘති 09 කට අදාළ කාර්යයන් 14 ක් සමාලෝචිත වර්ෂය තුළ | 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය | ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති පරිදි කටයුතු ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කිරීම ආරම්භ කර, ඒ සඳහා රු.මිලියන 25 ක් වැය කර තිබුණද, එම ව්‍යාපෘතිවල කාර්යසාධනය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | ලැබීමෙන් පසු එහි කටයුතු ආරම්භ කලද, අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් නොවූ බැවින් එම සංශෝධනයන් එක් කරමින් 2024 ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර 2024 දී වඩාත් කාර්යක්ෂම අයුරින් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මෙහි කාර්ය සාධනයක් ලබා කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. | |
| **(ඇ)** | 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර තිබුණු පාපැදිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ රු.2,650,000ක පිරිවැයක් දරා පාපැදිවල ඇලවීම සඳහා පරාවර්තිත ස්ටිකර් මුද්‍රණය කිරීමට ආයතනය විසින් කටයුතු කර තිබුණි. | වර්ෂය ආරම්භ වීමට පෙර හඳුනාගැනීමට නොහැකි වූ අත්‍යාවශ්‍ය ලෙස ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති සඳහා යෝජනා ඉදිරිපත් වුවහොත් ඒ අනුව ක්‍රියාකාරී සැලසුම් සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලබයි. මිලදී ගන්නා ලද රු.2,650,000 ක් වටිනා ස්ටිකර් බෙදාදීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමේ අපේක්ෂාවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර ඇතත්, එකී කාර්ය ඉටු කර නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | හඳුනාගන්නා ලද අත්‍යාවශ්‍ය නව ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති පොත් හා වෙනත් තොරතුරු පරිශීලනය කිරීම සඳහා 2005 අප්‍රේල් 04 දිනැති අංක 1387/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2(ආ) හි සඳහන් පරිදි මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාමට 2017 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. එසේම 2021 වර්ෂයේදී එය ඊ-පුස්තකාලයක් ලෙස රු.570,000 පිරිවැයක් සහිතව අවසන් කර තිබුණි. නමුත් 2023 ආරම්භයේදී පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ මෙම යෝජනාව සඳහා රු.මිලියන 0.7 ක් වෙන් කර ක්‍රියාකාරකම් තුනක් යටතේ ඊ-පුස්තකාලය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙන් මෙම යෝජනාව ඉවත් කර තිබුණි. ඒ අනුව ඊ-පුස්තකාලය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | 2021 වර්ෂයේදී ස්ථාපිත කරන ලද සභාවේ විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම හා ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය 2023 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබුණද, 2023 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවීම හේතුවෙන් සිදුවී ඇති දෝෂය හඳුනාගෙන එය 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද අතර, විද්‍යුත් පුස්තකාලය පිහිටුවීමේ අරමුණු ඉටුවන පරිදි 2024 වර්ෂයේදී එය යාවත්කාලීන කිරීමටත් ඒ සම්බන්ධයෙන් ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | යෝජනාවෙහි ඉදිරි කටයුතු විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| **(ඉ)** | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ කුළුණු 01 යටතේ ක්‍රියාත්මක කර තිබුණු “යතුරුපැදි අනතුරු අවම කිරීම” සඳහා වන පර්යේෂණයක් අදියර 4ක් යටතේ සිදුකර 2022 වර්ෂය තුළ අවසන් කර වාර්තා ලබා ගැනීමට බාහිර පාර්ශවයක් වෙත එකඟතා ගිවිසුමකට අනුව පවරා තිබුණි. 2023 වර්ෂයේ දී එහි අදියර 2 ක් පමණක් සම්පූර්ණ කර වාර්තාවක් සභාවට ලබා දී තිබුණද, මේ වනවිට පර්යේෂණයේ ඉතිරි අදියර 2 ක ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් පැන නැගී ඇති අතර, ඒ එදහා මෙතෙක් දරා තිබූ රු.700,000 ක මුදල නිශ්කාර්ය වී තිබුණි. තවද,ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමේ අවිනිශ්චිතතාවය හා එකඟතා ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පර්යේෂණ කාර්යයයෙහි අදියර 2 ක් සම්පූර්ණ කර එහි වාර්තාවන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබී ඇති අතර 2024 වර්ෂයේදී අදාළ පාර්ශවය විසින් ඉතිරි වාර්තා දෙකෙන් එක් වාර්තාවක් සභාව වෙත යොමු කර ඇත.මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් විමසා ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | ගිවිසුම් කඩවීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු අතර පර්යේෂණය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ඇස්තමේන්තුගත මුළු ආදායම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු.මිලියන 114 ක් හා රු.මිලියන 119 වූ අතර සත්‍ය ආදායම රු.මිලියන 170 ක් හා සත්‍ය ප්‍රාග්ධන වියදම රු.මිලියන 28 වූයෙන් ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර රු.මිලියන 56 ක් එනම් සියයට 49 ක ධන විචලනයක් ද ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම හා සත්‍ය වියදම අතර රු.මි.91 ක් එනම් සියයට 76 ක ඍණ විචලනයක්ද නිරීක්ෂණය විය. ඒ අනුව සභාව විසින් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2023 අයවැය ලේඛනය අගෝස්තු මාසයේදී සංශෝධනය කරන ලද අතර,සංශෝධිත කටයුතු ආරම්භ කලද අපේක්ෂිත පරිදි කාර්යන් අවසන් කිරීමට නොහැකිවූ බැවින් එම සංශෝධනයන් එක් කරමින් 2024 අයවැය ලේඛණය සකස් කරන ලදි.2024 වර්ෂයේදී පෙර වර්ෂයේ සිදුවූ ගැටළු අවම කරගනිමින් වඩාත් කාර්යක්ෂම අයුරින් අපේක්ෂිත කාර්ය සාධනය ලඟා කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් මාර්ග ආරක්ෂාව ආශ්‍රිතව ඉටුකර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන සභාවේ 2022 – 2024 තුන් අවුරුදු මෙහෙයුම් සැලැස්මෙහි කුළුණු 05 ක් යටතේ එම අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාත්මක කළයුතු කාර්යයන් ඇතුළත් කර 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය තුලදී ඉතා අවම මට්ටමක පැවතීම හේතුවෙන් සභාවේ තිරසර සංවර්ධන අරමුණු කරා ලගා වීමේ ප්‍රගතිය ද අවම මට්ටමක පැවතුණි. | සභාව සඳහා තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැති අතර. 2022-2024 වර්ෂයන් සඳහා වන තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරන ලද අතර, එය මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දශකය සඳහා වන එක්සත් ජාතීන්ගේ මාර්ග ආරක්ෂණ සහයෝගීතාව විසින් යෝජිත කුළුණු පහකින් යුක්ත ප්‍රවේශය මත පදනම් වේ. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කල යුතුය. |